**සැ. යු. -** 2016.09.23 දින පළ වූ අංක 1986 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,987 - 2016 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2016.09.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1718 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 1726 |


*සැ. යු.* - රාජිත සේනාරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජුනි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ඔක්තෝබර් මස 21 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ඔක්තෝබර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන නිවේදන

## කන්දකැටිය ප්‍රාදේශීය සභාව

### වාරවාර්තා සැපයීමට නියම කිරීමේ යෝජනාව ගැසට් නිවේදනයේ පළකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව කන්දකැටිය ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්.එස්.එම්.එන්. වනසිංහ
ලේකම්,
කන්දකැටිය ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 09 වැනි දින දීය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව කන්දකැටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්ය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීමේ කාර්යය සඳහා එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි, එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මම මෙයින් තීරණය කරමි.

***දේපළවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට/ අක්කර බදු කාර්යය සඳහා දේපළ සත්‍යාක්ෂණය කිරීමට අවශ්‍ය වාර වාර්තාව***

.......................................... ප්‍රාදේශීය සභාව
(ආකෘතිය සම්පූර්ණ කිරීමට පෙර අවසානයේ ඇති උපදෙස් හොඳින් පිළිපදින්න)

01. දේපළෙහි අයිතිකරු/ වන්ගේ සම්පූර්ණ නම/ නම් : (හවුල් අයිතියක් ඇති විට සෑම අයිතිකරුවකුගේ ම නම්)

*(අ)* ..........................................................................................................
*(ආ)* ..........................................................................................................
*(ඇ)* ..........................................................................................................
*(ඈ)* ..........................................................................................................
*(ඉ)* ..........................................................................................................

02. දේපළෙහි අයිතිකරු/ වන්ගේ ලිපිනය/ ලිපින : (හවුල් අයිතියක් ඇති විට ඉහත අංක 01 හි අනුපිළිවෙල අනුව)

*(අ)* ..........................................................................................................
*(ආ)* ..........................................................................................................
*(ඇ)* ..........................................................................................................
*(ඈ)* ..........................................................................................................
*(ඉ)* ..........................................................................................................

03. අයිතිකරු/ වන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය/ අංක : (හවුල් අයිතියක් ඇති විට ඉහත අංක 01 හි අනුපිළිවෙලට)

*(අ)* ..........................................................................................................
*(ආ)* ..........................................................................................................
*(ඇ)* ..........................................................................................................
*(ඈ)* ..........................................................................................................
*(ඉ)* ..........................................................................................................

04. ඉදිරි කටයුතුවල දී ප්‍රාදේශීය සභාව සමග ගණුදෙනු කිරීමේ පහසුව සඳහා විද්‍යුත් තැපැල් ලිපිනයක් තිබේ නම්, අයිතිකරු/ වන්ගේ විද්‍යුත් තැපැල් ලිපිනය/ ලිපින : (හවුල් අයිතියක් ඇති විට ඉහත අංක 01 හි අනුපිළිවෙල අනුව)

*(අ)* ..........................................................................................................
*(ආ)* ..........................................................................................................
*(ඇ)* ..........................................................................................................
*(ඈ)* ..........................................................................................................
*(ඉ)* ..........................................................................................................

05. අයිතිකරු හෝ අයිතිකරුවන් වෙනුවෙන් මේ ආකෘතිය සම්පූර්ණ කරනු ලබන්නේ ඇටෝර්නි බලය පැවරී ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් වන විට, ඇටෝර්නි බලකරු/කරුවන් පිළිබඳ විස්තර.

| | අයිතිකරුගේ නම | ඇටෝර්නි බලකරුගේ නම | ජා.හැ.ප. අංකය |
|---|---|---|---|
| (අ) | ................................... | ................................... | ................................... |
| (ආ) | ................................... | ................................... | ................................... |
| (ඇ) | ................................... | ................................... | ................................... |
| (ඈ) | ................................... | ................................... | ................................... |
| (ඉ) | ................................... | ................................... | ................................... |

06. දේපළෙහි පිහිටීම :
- (අ) ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම : අංකය .................. නම ...................................
- (ආ) ප්‍රාදේශීය සභා කොට්ඨාස අංකය සහ නම (දන්නේ නම්) :
  අංකය :.................. නම :..................
- (ඇ) පාර හෝ වීථිය :...................................

07. වරිපනම් හෝ අක්කර බදු අංකය (දැනටමත් අංකයක් දී ඇත්නම්) :..................

08. ඉඩමේ ප්‍රමාණය : අක්කර : ..................රූඩ් :..................පර්චස් :............... (හෙක්ටයාර්..................)

09. ඉඩමට මායිම් : ඉඩමේ ඔප්පුවේ සහ මිනින්දෝරු සැලැස්මේ දැක්වෙන මායිම් අනුව සටහන් කළ යුතු අතර, ඒ තොරතුරු සමග මේ විස්තර නිවැරදි විය යුතු ය.

උතුරට : ........................................................................................................
........................................................................................................
........................................................................................................

නැගෙනහිරට : ........................................................................................................
........................................................................................................
........................................................................................................

දකුණට : ........................................................................................................
........................................................................................................
........................................................................................................

බස්නාහිරට : ........................................................................................................
........................................................................................................
........................................................................................................

10. අයිතිකරුට/ අයිතිකරුවන්ට ඉඩම අයත් වූ ආකාරය :
(අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් දේපළට අදාළව (වසර 30 ක පූර්ව කාලයක් සඳහා) නිකුත් කළ පත් ඉරුවල මුල් පිටපත සහ සහතික කරන ලද පිටපත් අමුණන්න)

11. (අ) ඔප්පුවේ අංකය :........................
- (ආ) නොතාරිස්තැනගේ නම :...............................................
- (ඇ) ලියාපදිංචි කළ දිනය :........................
  (ඔප්පුවේ සහතික කරන ලද පිටපත් දෙකක් අමුණන්න)

12. ඉඩමේ මිනින්දෝරු සැලැස්ම පිළිබඳ විස්තර :
- (අ) අංකය :........................
- (ආ) සැලසුමේ දිනය :........................
- (ඇ) මිනින්දෝරුතැනගේ නම :........................
  (මිනින්දෝරු සැලැස්මේ සහතික කරන ලද පිටපත් දෙකක් අමුණන්න - ප්‍රාදේශීය සභාවෙන් අනුමැතියක් ලබා ඇති අනුබෙදුම් සැලැස්මක් තිබෙන විට එහි සහතික පිටපත් අවශ්‍ය වේ.-)
- (ඈ) සැලැස්මේ පරිමාණය :........................

13. ඉඩම තුළ ගොඩනැගිලි ඇත්නම් - (ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා ඇති ගොඩනැගිලි සැලසුම් තිබේ නම්, ඒවායේ (පිටපතෙහි ප්‍රමාණයටම ලබාගත්) සහතික කළ පිටපත් දෙකක් අමුණන්න)

(අ) පවතින ගොඩනැගිලි සංඛ්‍යාව : …………සහ (ආ) එක් එක් ගොඩනැගිල්ලේ විස්තර :

| ගොඩනැගිලි අංකය<br>1 | ස්වභාවය<br>2 | භාවිත කරන කාර්යය<br>3 |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ප්‍රධාන ගොඩනැගිල්ලට අංක 01 වශයෙන් යොදමින් ඉතිරි ගොඩනැගිලි එකින් එක අංක කර, 1 වැනි තීරුවේ ද, එක් එක් ගොඩනැගිල්ල තනි මහලකින් ද, දෙමහල් ද, තෙමහල් ද ආදී වශයෙන් 2 වැනි තීරුවේ ද, එක් එක් ගොඩනැගිල්ල භාවිත කරනු ලබන ආකාරය නේවාසික/ වාණිජ/ කර්මාන්ත ශාලා ද යනුවෙන් 3 වන තීරුවේ ද සටහන් කරන්න.)

14. ඉඩමේ හෝ ගොඩනැගිල්ල තුළ යන්ත්‍ර සූත්‍ර සවිකර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර :

| යන්ත්‍ර සූත්‍ර වර්ගය<br>1 | මිලදී ගත් දිනය<br>2 | වටිනාකම<br>3 |
|---|---|---|
| අ. | | |
| ආ. | | |
| ඇ. | | |
| ඈ. | | |
| ඉ. | | |

(1 වැනි තීරුවේ යන්ත්‍රය කුමක් ද යන්න ද, ඒ යන්ත්‍රය මිල දී ගත් දිනය 2 වැනි තීරුවේ ද, එක් එක් යන්ත්‍රය මිල දී ගත් දිනයේ වටිනාකම කොපමණ ද යන්න 3 වැනි තීරුවේ ද යන්න සටහන් කරන්න. ඒ සමගම ඒ එක් එක් යන්ත්‍ර සූත්‍ර පිළිබඳ විස්තරය, මිල දී ගත් දිනය සහ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක පිටපත් දෙකක් සහ මිල දී ගත් කුවිතාන්සිවල පිටපත් දෙක බැගින් මේ ආකෘතියට අමුණන්න)

15. ඉඩම තුළ වගාවක් පවතී නම් ඒ පිළිබඳ විස්තර.

……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………

16. දේපළ කුලියට හෝ බද්දට දී තිබේ නම්, කුලී නිවැසියා හෝ බදුකරුගේ :

(අ) නම:……………………………………………………………………………

(ආ) ජාතික හැඳුනුම් පත්‍ර අංකය :………………………………………………………………………………

(ඇ) තව දුරටත් ඉතිරි වී ඇති ගිවිසුම් ගත කාලය : අවුරුදු:……… මාස:………දින:………

17. ඉහත සඳහන්කර ඇති තොරතුරු මාගේ/ අපගේ දැනීමේ හා විශ්වාසයේ ආකාරයට නිවැරදි බවත්, මෙහි කිසිදු අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරු කිසිවක් ඇතුළත්කර නොමැති බවටත් සහතික කරමි/කරමු. මේ ලේඛනයේ ඇතුළත් කර ඇති තොරතුරු සහ අමුණා ඇති ලේඛන කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව තහවුරු වුවහොත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට වරදකට වරදකරු/ වරදකරුවන් වන බවත්, වරදකරු/ වරදකරුවන් කරනු ලැබුවහොත් අධිකරණය විසින් නියම කරනු ලබන දඩයකට මම/අපි යටත් වන බවත් දනිමි./දනිමු.

දේපළෙහි අයිතිකරු/ අයිතිකරුවන් නැතහොත් ඇටෝර්නි බලකරු/ බලකරුවන් වන මම; *

| | *නම/නම්* | *අත්සන/අත්සන්* |
|---|---|---|
| *(අ)* | ...................................................... | ............................................... |
| *(ආ)* | ...................................................... | ............................................... |
| *(ඇ)* | ...................................................... | ............................................... |
| *(ඈ)* | ...................................................... | ............................................... |
| *(ඉ)* | ...................................................... | ............................................... |

දිනය : 20.....................

* - අදාළ නොවන වචන කපා හරින්න.

කරුණාකර, දේපළට පිවිසිය හැකි මාර්ගය පැහැදිලිව මෙහි පහත කොටුවේ සටහන් කරන්න.

**විශේෂයෙන් දැනගත යුතු කරුණු සහ ආකෘතිය සම්පූර්ණ කිරීමට උපදෙස්**

(අ) ඔබ විසින් සපයනු ලබන මේ තොරතුරුවල රහස්‍යභාවය නිරන්තරයෙන් රැකීමට ප්‍රාදේශීය සභාව බැඳී සිටින බව පළමුවෙන් ම ඔබට දැන්විය යුතු ව ඇත. අධිකරණ නියෝගයකින් විනා කිසිදු අවස්ථාවක, මේ තොරතුරු කිසිවක් ඉඩමේ, ඒ අවස්ථාවේ නීත්‍යානුකූල අයිතිකරුවෙකු වශයෙන් සභාවේ ලේඛනවල සටහන් ව නොමැති වෙනත් යම් තැනැත්තකුට නිකුත් නොකරන බව සහතික කරමි.

(ආ) මේ දේපළට අදාළ ව, ඉදිරියේ දී වරිපනම් අංකයක් හෝ අක්කර බදු අංකයක් නිකුත් කිරීම නැතහොත් මේ වන විටත් එවැනි අංකයක් නිකුත්කර තිබීම සහ වරිපනම් කාර්යය හෝ අක්කර බදු කාර්යය ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා ම, මේ ආකෘතියෙහි සඳහන් යම් මිනින්දෝරු සැලැස්මකට අනුමැතියක් දී ඇති ලෙස හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබා ගත යුතු වන ඉදිකිරීම් බලපත්‍රයක් නිකුත්කර ඇති ලෙස හෝ එවැනි යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් අනුකූලතා සහතිකයක් නිකුත් කර ඇති ලෙස හෝ සැලකීමට ඒ දේපළෙහි අයිතිකරුට නැතහොත් අයිතිකරුවන්ට කිසිදු නීතිමය අයිතියක් නැති සේ සැලකිය යුතු ය.

(ඇ) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ හෝ නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද "සැලසුම් හා ගොඩනැගිලි නියෝග" යටතේ යම් අනුමැතියක් හෝ බලපත්‍රයක් ලබා ගැනීමට ඉඩමේ අයිතිකරු නැතහොත් අයිතිකරුවන් යටත් වන යම් අවස්ථාවක, ඒ අනුමැතිය හෝ බලපත්‍රය ලබා ගැනීමට ඔහු නැතහොත් ඔවුන් යටත් විය යුතු ය.

(ඉ) මේ ආකෘතිය නිකුත් කරනු ලබන්නේ අදාළ දේපළෙහි ඒ අවස්ථාවේ පදිංචිව සිටින තැනැත්තාට හෝ ඒ දේපළෙහි ඒ අවස්ථාවේ සිටින තැනැත්තාට වේ.

(ඊ) මේ අකෘතිය සමග ලැබෙන නිවේදනය ලබා ගන්නා තැනැත්තා අදාළ දේපළෙහි අයිතිකරු නොවේ නම්, වහාම අදාළ නිවේදනය සහ මේ ආකෘතිය දේපළෙහි අයිකරුට ලැබීමට සැලැස්වීම, ඔහුගේ වගකීම විය යුතු ය.

(උ) මේ ආකෘතිය අදාළ දේපළෙහි අයිතිකරු විසින් හෝ හවුල් අයිතිකරුවන් සිටී නම්, ඔවුන් සියළුම දෙනා විසින් ම අත්සන් කර ඉදිරිපත් කළ යුතු ය.

(ඌ) යම් හෙයකින් මේ ආකෘතිය සම්පූණ කිරීමට අයිතිකරුවකුට/අයිතිකරුවන්ට නොහැකි වන්නේ නම්, ඒ අයිතිකරු හෝ අයිතිකරු විසින් ඇටෝර්නි බලය පවරන ලද යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් මේ ආකෘතිය සම්පූර්ණ කර ඉදිරිපත් කළ හැකි ය. එසේ වුව ද, ඒ ඇටෝර්නි බලකරු විසින් මේ ආකෘතිය සමග පහත සඳහන් ලියවිලි ද ඉදිරිපත් කළ යුතු ය.

(i) ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයේ සහතික කරන ලද පිටපත් දෙකක්,

(ii) ඇටෝරනි බලකරුට මේ කාර්යය කිරීම හෙවත් අදාළ දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ඇටෝර්නි බලපත්‍රයෙන් බලය පවරා දී තිබෙන බවටත්, බලය පවරන ලද තැනැත්තා මේ වන තෙක් ම ජීවතුන් අතර සිටින බවට සහ අදාළ ඇටෝර්නි බලපත්‍රය මේ වන තෙක් ම අවලංගු කර නොමැති බවටත් ප්‍රකාශ කෙරෙන දිවුරුම් ප්‍රකාශයක් සහ ඒ දිවුරුම් ප්‍රකාශයේ සහතික කරන ලද පිටපතක්.

(එ) කරුණාකර, ආකෘතියෙහි එක් එක් අංකය සඳහා තොරතුරු ලබාදීමට පහත උපදෙස් අනුගමනය කරන්නः-

(01) දේපළෙහි අයිතිකරු හෝ අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම නැතහොත් නම් මෙහි ඇතුළත් කරන්න,

(02) ඉහත අංක 01 හි දක්වා ඇති අනුපිළිවෙලින් එක් එක් අයිතිකරුගේ ලිපිනයන් සඳහන් කරන්න,

(03) ඉහත අංක 01 හි දක්වා ඇති අනුපිළිවෙලින් එක් එක් අයිතිකරුගේ ජාතික හැඳුනුම් පත්‍රවල අංකයන් මෙහි සඳහන් කරන්න,

(04) ප්‍රාදේශීය සභාව සමග ඉදිරි කටයුතු විද්‍යුත් තැපැල මගින් සිදුකිරීමට අවස්ථාව ලබාදීමට අපේක්ෂා කරන බැවින්, ඔබගේ සහ ප්‍රාදේශීය සභාවේ පහසුව සඳහා අයිතිකරුට හෝ අයිතිකරුවන්ට විද්‍යුත් තැපැල් ලිපිනයන් තිබේ නම්, ඉහත අංක 01 හි දක්වා ඇති අනුපිළිවෙලින් එක් එක් අයිතිකරුගේ විද්‍යුත් තැපැල් ලිපිනයන් මෙහි සඳහන් කරන්න,

(05) කිසියම් හේතුවක් නිසා දේපළෙහි අයිතිකරුට නැතහොත් අයිතිකරුවන්ට මේ ආකෘතිය සම්පූර්ණ කර භාර දීමට නොහැකි වන අවස්ථාවක, ඒ අයිතිකරු නැතහොත් අයිතිකරුවන් විසින් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට මේ කාර්යය සඳහා නැතහොත් අදාළ ඉඩමේ පරිපාලන සහ වාර්තා සැපයීම සඳහා ඇටෝර්නි බලපත්‍රයක් මගින් බලය පවරා දී ඇත්නම්, එසේ ඇටෝර්නි බලය පැවරී ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින් ඒ දේපළෙහි අයිතිකරු හෝ අයිතිකරුවන් වෙනුවෙන් මේ ආකෘතිය සම්පූර්ණ කර භාර දීමට හැකියාව ඇත. එවැනි යම් අවස්ථාවක, ඉහත උපදෙස්වල (ඌ) ඡේදය අනුව ක්‍රියා කළ යුතු ය,

(06) ඔබගේ දේපළ පිහිටා ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය හා නම ද, ප්‍රාදේශීය සභාවට අදාළ ඡන්ද කොට්ඨාසය (දන්නේ නම්) ද සහ ඉඩම මුහුණ ලා තිබෙන ප්‍රධාන පාරේ හෝ වීථියේ නාමය (නාමයක් ඇත්නම්) මෙහි සඳහන් කරන්න. කෙසේ වුව ද, මේ ආකෘතියේ 6 වැනි පිටුවේ ඉල්ලා ඇති ආකාරයට දේපළට ප්‍රවේශ වීමට පහසු මාර්ගය රූප සටහනකින් පෙන්වන්න,

(07) ඔබගේ දේපළට වරිපනම් කාර්යය සඳහා වරිපනම් අංකයක් හෝ අක්කර බදු කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවෙන් අක්කර බදු අංකයක් ලබා දී ඇත්නම්, ඒ අංකය නිවැරදි ව මෙහි සටහන් කරන්න,

(08) ඉඩමේ ප්‍රමාණය අක්කර, රූඩ් සහ පර්චස් පරිමාණයෙන් සහ හෙක්ටයාර් පරිමාණයෙන් මෙහි සටහන් කරන්න. කෙසේ වුව ද, මෙහි සඳහන් කරන භූමි ප්‍රමාණය ඉඩමේ ඔප්පුවේ දැක්වෙන ප්‍රමාණය සහ ඉඩමේ මිනින්දෝරු සැලැස්මේ දැක්වෙන භූමි ප්‍රමාණය ද සමග නිවැරදි විය යුතු ය. යම් වෙනසක් වේ නම් ඊට හේතු දැක්වෙන සටහනක් වෙනම මේ ආකෘතියට අමුණන්න,

(09) අදාළ ඉඩමේ මායිම් මෙහි නිවැරදිව සටහන් කරන්න.

(10) අයිතිකරුට නැතහොත් අයිතිකරුවන්ට අදාළ දේපළ අයිති වූ ආකාරය මෙහි සඳහන් කරන්න. ඒ සමගම, ඉඩමේ හිමිකම තහවුරු කෙරෙන අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරනු ලබන ඉඩම් ලියාපදිංචි කිරීම පිළිබඳව පසුගිය වසර 30 ක කාලයක් සඳහා වන පත් ඉරුවල මුල් පිටපත සහ එහි සහතික කරන ලද ඡායා පිටපතක් අමුණන්න,

(11) ඔප්පුව පිළිබඳ ඉල්ලා ඇති තොරතුරු මෙහි ඇතුළත් කර, ඔප්පුවේ සහතික කරන ලද ඡායා පිටපත් දෙකක් අමුණන්න,

(12) ඉඩම සඳහා අඳින ලද මිනින්දෝරු සැලැස්මේ විස්තර මෙහි සටහන් කර, සැලැස්මේ ප්‍රමාණයට ම ලබාගත් ඡායා පිටපත් දෙකක් සහතික කර අමුණන්න. ඉඩමේ සැලැස්ම සඳහා ප්‍රාදේශීය සභාවෙන් අනුමැතියක් ලබාගෙන ඇති විටෙක, මෙයට ඇමිණිය යුත්තේ එහි පිටපත් බව සලකන්න,

(13) ඉඩමේ ගොඩනැගිලි කිසිවක් වේ නම් (තාවකාලික ගොඩනැගිලි ද ඇතුළත් ව), ඒ පිළිබඳ විස්තර පිළිවෙලින් මෙහි සඳහන් කරන්න. ගොඩනැගිලි කිහිපයක් ඇති විට, ප්‍රධාන ගොඩනැගිල්ල වශයෙන් සැලකෙන ගොඩනැගිල්ලට මෙහි 1 වැනි තීරුවේ ගොඩනැගිලි අංකය ලෙස අංක 01 වශයෙන් සලකා ඉතිරි ගොඩනැගිලිවලට පිළිවෙලින් අංක දෙමින් මෙහි තොරතුරු ඇතුළත් කරන්න. මෙහි ස්වභාවය යනුවෙන් අදහස් කරනුයේ ගොඩනැගිල්ල තනි මහලක එකක් ද නැතහොත් මහල් කිහිපයක එකක් නම් මහල් කීයක් ද යන්න වේ. එසේ ම එක් එක් ගොඩනැගිල්ල භාවිතා කරනුයේ කුමන කාර්යයකට ද යන්නත් නිවැරදිව සටහන් කරන්න,

(14) ඉඩම තුළ හෝ ගොඩනැගිලි තුළ යන්ත්‍ර සූත්‍ර කිසිවක් සවිකර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර මෙහි සඳහන් කරන්න,

(15) ඉඩම තුළ ස්ථිර හෝ නිතිපතා කෙරෙන වගාවකට යොමුකර ඇත්තේ නම්, ඒ වගාව සහ වගාවට යට වී ඇති බිම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් කරන්න,

(16) දේපළ කිසියම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට කුලියට හෝ බද්දට දී ඇති විටෙක, මේ අංකය යටතේ ඉල්ලා ඇති තොරතුරු සපයන්න,

(17) මේ යටතේ වන සහතිකය සඳහා අත්සන් කරනු ලබන්නේ දේපළෙහි අයිතිකරු හෝ අයිතිකරුවන් ද නැතහොත් ඇටෝර්නි බලකරු හෝ ඇටෝර්නි බලකරුවන් ද යන්න පැහැදිලි වන පරිදි අදාළ නොවන වචන කපා ඉවත් කරන්න. මෙහි සඳහන් සහතිකය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ නියමයන්ට අනුකූල ව සකස් කර ඇත. ඒ උපවගන්තියේ උධෘතයක් පහත දක්වා ඇතඃ-

"(3) *(අ)* මෙහි නිශ්චිත ව සඳහන් වාර වාර්තාව සපයන ලෙස නියම කරනු ලැබූ දින සිට දවස් හතක් ඇතුළත එම වාර වාර්තාව සැපයීම පැහැර හරින හෝ නොසලකා හරින; හෝ

*(ආ)* දැනුවත්ව ම අසත්‍ය හෝ සාවද්‍ය වාර වාර්තාවක් සපයන ; හෝ

*(ඇ)* ඉහත කී පරිදි බලය පවරන ලද යම් තැනැත්තකුට එවැනි යම් ගෙයකට, ගොඩනැගිල්ලකට, ඉඩමකට හෝ ගෙපතකට ඇතුල් වීමට හෝ පරීක්ෂා කිරීමට හෝ අවශ්‍ය වූයේ නම් මැනීමට අවහිර කරන, බාධා කරන හෝ වළක්වාලන ; හෝ

*(ඈ)* (2) වැනි උපවගන්තිය අනුව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය."

……………………………………… ප්‍රාදේශීය සභාව ………………………………PRADESHIYA SABHA

වාර වාර්තා ඉදිරිපත් කිරීම සඳහා හිමිකම් ඔප්පු සාරාංශය - Abstract Title of Deed to Produce the returns

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් නිකුත් කළ පත් ඉරු ආශ්‍රයෙන් වර්තමාන අයිතිකරු/ කරුවන් දක්වා හිමිකම් වාර්තාව සකස් කරන්න.

| ඔප්පුවේ අංකය<br>No. of Deed | දිනය<br>Date | නොතාරිස්ගේ නම සහ ලිපිනය<br>Name of Notary and Address | ඔප්පුවේ ස්වභාවය<br>Nature of Deed | දීමනාකරුගේ නම හා ලිපිනය<br>Granter's Name and Address | ලැබුම්කරුගේ නම හා ලිපිනය<br>Grantee's Name and Address | ප්‍රමාණය සහ මායිම්<br>Boundaries and Extent | වටිනාකම<br>Consi-deration | වීථියේ නම හා වරිපනම් අංකය<br>Asst.No. and Street of Premises | කොට්ඨාශ අංකය<br>Ward No. | වෙනත් කරුණු<br>Remarks |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

(මෙම කඩදාසිය ප්‍රමාණවත් නොවන්නේ නම් මේ ආකෘතියේ ඡායාස්තිථික පිටපත් ලබාගෙන පිටපත් දෙක බැගින් පිළියෙල කර මෙම ඉල්ලුම් පත්‍රයට අමුණන්න.)

නීතිඥ/නොතාරිස්තැනගේ රබර් මුද්‍රාව.
Seal of the Attorney at Law/Notary.

ඉහතින් දක්වා ඇති දේපළෙහි ඔප්පුවේ හිමිකම් පිළිබඳ සත්‍ය සාරාංශයක් බව සහතික කරමි.
I hereby certify that above is a true extract of the title deed relating to the above premises.

……………

දිනය/Date :……………

නීතීඥතැනගේ/නොතාරිස්ගේ අත්සන.
Signature of Attorney - at - law/Notary Public.

## CERTIFICATE OF OWNER SHIP

I …………………………………………………… Attorney - at - law …………………………………… and Notary Public of ….......................................................................................................................... do hereby certify that I have examined the title deeds relating to Premises No …………………………………… Road Lot No………………of plan No ……………………………………… dated ………………………………………………………… drawn by Licensed Surveyor Mr. ………………………………………………………………………… and I am satisfied that the Guarantee ………………………………………………………………………….. referred to in abstract of Title is the rightful owner of Premises No. ………………………………………………

Date: ………………..

……………………………………
Signature of Attorney- at- law/
Notary Public and Rubber stamp

09-986

## මොරටුව මහා නගර සභාව

### 2017 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තුමා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව පහත දැක්වෙන යෝජනාවට අනුව 2017 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමට මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස්තුමාගේ 2016.07.18 දිනැති අනුමැතිය ලබා දී ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2017 වර්ෂයට පනවන ලද වරිපනම් බදු ඒ වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික 4 කින් මොරටුව මහා නගර සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බව වැඩි දුරටත් දන්වා සිටිනු ලැබේ.

2017 වර්ෂය සඳහා වන සම්පූර්ණ පරිපනම් බදු මුදල 2017 ජනවාරි 31 දිනට ගෙවා අවසන් කරනු ලැබුවහොත් 10% ක වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදළ වරිපනම් එම කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට හෝ ඊට පෙර ගෙවා අවසන් කරනු ලැබුවහොත් එම කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් 5% ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

නියමිත කාල සීමාව තුළ ගෙවිය යුතු වරිපනම් බදු මුදල් නොගෙවා පැහැර හරින අයගෙන් සෑම පදිංචි නිවාසයකින් 15% ක හා සෑම වානිජ, කර්මාන්ත, මුඩු ඉඩම් සහ අනෙකුත් ස්ථානවලින් 20% ක වරෙන්තු ගාස්තුවක් අදළ සෑම කාර්තුවක් සඳහා අයකරනු ලබන බවද දැනුම් දෙනු ලැබේ.

එම්.එම්.සී.කේ.කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් (වැ.බ.),
මොරටුව මහා නගර සභාව.

2016 ජුලි මස 22 වැනි දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේ දී,

**යෝජනාව**

(252 වැනි අධිකාරිය) මහා නගර සභා ආඥපනතේ 230 වැනි වගන්තිය ප්‍රකාර මොරටුව මහා නගර සභාව විසින් කරනු ලැබිය හැකි සීමා කිරීමේ කොන්දේසි සහ නිදහස් කිරීම් වලට යටත්ව 2016.07.18 දිනැති නාගරික කොමසාරිස් අනුමැතිය පරිදි මොරටුව මහා නගර සභා බල ප්‍රදේශ සීමාව තුළ පිහිටි සියළුම දේපලවලින් 2016 වර්ෂයේ වාර්ෂික තක්සේරුව 2017 වර්ෂයට ද ඒ ලෙසම පවත්වා ගනිමින් වාර්ෂික තක්සේරුව මත පදනම්ව පහත සඳහන් ප්‍රතිශතයන්ට අනුව,

* සියලුම පදිංචි වාසස්ථානවලින් වාර්ෂික වටිනාකමින් 7% ක වරිපනම් බද්දක් ද,
* පදිංචි නිවාස නොවන අනෙකුත් සියලුම වානිජ, කර්මාන්ත, රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ආදී දේපලවල වාර්ෂික තක්සේරු වටිනාකමින් 16% ක වරිපනම් බද්දක් ද අය කිරීම
* මුඩු ඉඩම් සහ තනාගෙන යන ගොඩනැගිලිවල වාර්ෂික තක්සේරු වටිනාකමින් 20% ක බද්දක් ද

2017 වර්ෂය වෙනුවෙන් මොරටුව මහා නගර සභාව විසින් පනවා අයකරනු ලබන බවත්, එකී බදු මුදල් පිළිවෙලින් 2017 වර්ෂයේ දී මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන්හි දී හෝ ඊට පෙර සමාන කොටස් 4කින් හෝ සම්පූර්ණයෙන් හෝ ගෙවිය යුතු බව මොරටුව මහා නගර සභාව යෝජනා කරන්නීය.

09-1036

---

## බේරුවල ප්‍රාදේශීය සභාව

### 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9:3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව වර්ෂ 2016 ක්වූ අගෝස්තු මස 19 දින අංක 637 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි.

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/47 හා 2014.11.14 දින දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා අනුශංගික විධිවිධාන පනතේ 2 වන වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලදුව ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 හා 2015.12.28 දිනැති *ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කර ඇත.

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3වන වගන්තිය යටතේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථා බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017.01.01 දින සිට අදාළ විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය යටතේ තීරණය කරමි.

තවද, මෙම තීරණය ගනු ලබන මෙදින වන විට බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 1952 අංක 6 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3වන වගන්තිය යටතේ අදාළ කර ගනිමින් බලාත්මක වන පහත උපලේඛණගත නාමයන් යටතේ විස්තර කරන සම්මත අතුරු ව්‍යවස්ථා, එම සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ එතෙක් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි 2016.12.31 දිනෙන් පසුවට බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා අදාළ නොවිය යුතු බවටද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තීරණය කරමි.

**ඉහත කී උපලේඛනය**

අ) ප්‍රසිද්ධ පිට්ටනි පාවිච්චියට ගැනීම,
ආ) ලැගුම් නිවාස,
ඇ) හෝටල්,
ඈ) බත්කඩ ආපනශාලා, තේ, කෝපි කඩ,
ඉ) බේකරි,
ඊ) මාළු විකිණීම,
උ) මස් විකිණීම,
ඌ) අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම,
එ) සංචාරක වෙළෙන්දන්,
ඒ) ප්‍රචාරක දැන්වීම්.

එච්. ඩී. අනුලා සිරිමාන්න,
ලේකම් හා සභාවේ බලතල, කාර්ය,
කර්තව්‍යයන් ඉටුකරන නිලධාරි
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2016 සැප්තැම්බර් මස 13 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය සභාව,
ප්‍රධාන කාර්යාලය,
අළුත්ගම.

09-1141

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## වාරියපොල ප්‍රාදේශීය සභාව

### වරිපනම් බදු පැනවීම

වාරියපොල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන වාරියපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් යාපා මුදියන්සේලාගේ සේනානායක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු වබවට තීරණය කර ඇති බව නිවේදනය කරමි.

වයි. එම්. සේනානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2016 අගෝස්තු මස 31 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණ අංක 2610 - V**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වාරියපොල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශයැයි සභාව විසින් ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ නිවාසවල ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව 2017 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාරියපොල නගර කොට්ඨාසයේත් කටුපොත නගර කොට්ඨාසයේත් දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් ද,

පාදෙනිය, හංහමුණුව, රඹාවැව හා මහකෙළිය යන ප්‍රදේශයන්හි දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට දෙකක (2%) වාර්ෂික වරිපනම් බද්දක් ද වශයෙන් පනවා අයකළ යුතු බවටත් එකී වාර්ෂික වටිනාකම්, දේපළවල භෞතික වෙනස්වීම් මත සංශෝධනය කළ යුතු බවටත්,

ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වරිපනම් බද්ද මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් වාරියපොල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

තවද, 2017 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද වාරියපොල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2017 එම වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල වාරියපොල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද වාරියපොල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත්,

එකී බදු මුදල් එක් එක් කාර්තුව අවසානයේ දී නොගෙවනු ලබන අවස්ථාවකදී ව්‍යාපාරික ස්ථාන සඳහා සියයට විස්සක (20%) අධි ගාස්තුවක් ද, අනෙක් හිස්බිම් හා පදිංචි ස්ථාන හා සම්බන්ධයෙන් (15%)ක අධි ගාස්තුවක් ද අයකල යුතු බවටත් තීරණය කරමි.

*ඉහත කී උපලේඛනය*

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2017 මාර්තු 31 හෝ ඊට පෙර | 2017 ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2017 ජූනි 30 හෝ ඊට පෙර | 2017 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2017 සැප්තැම්බර් 30 හෝ ඊට පෙර | 2017 ජූලි 31 |
| හතරවන කාර්තුව | 2017 දෙසැම්බර් 31 හෝ ඊට පෙර | 2017 ඔක්තෝබර් 31 |

09-890/5

## වාරියපොල ප්‍රාදේශීය සභාව

## බලපත්‍ර ගාස්තු අයකිරීම

වාරියපොල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන වාරියපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් යාපා මුදියන්සේලාගේ සේනානායක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ඒ අනුව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම බද්දට යටත්වන කිසියම් පරිශ්‍රයක් පාවිච්චි කරන සෑම තැනැත්තෙකු විසින්ම එම පරිශ්‍රය පාවිච්චි කිරීම ආරම්භ කළ දින සිට දින 30ක් ඇතුළත බලපත්‍ර ගාස්තුවක් ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතු බවට වැඩිදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. සේනානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2016 අගෝස්තු මස 31 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණ අංක 2610- 1**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2017 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පොළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2016 වර්ෂයේ ලැබීම්වලින් සියයට 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

*උපලේඛනය*

| *I වන තීරය* | | *II වන තීරය* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු.1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | තේ සහ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 1,000 0 |
| 4. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් සහ බාබර් සාප්පු | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ශීතකළ මස් වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | සාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | කිරිපට්ටි හා කිරි වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | උකස් ලියාපදිංචි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සිසිල්බීම කර්මාන්ත ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ගව ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පොදු වෙළඳපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | තානායමක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | සංචාරක වෙළෙන්දෝ | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | පෞද්ගලික වෙළඳපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

09-890/1

## වාරියපොල ප්‍රාදේශීය සභාව

### ලැගුම් නිවාස හා නවාතැන් පළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

වාරියපොල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන වාරියපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් යාපා මුදියන්සේලාගේ සේනානායක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ලැගුම් නිවාස හා නවාතැන්පළවල් සඳහා බද්දක් 2017 වර්ෂයට අදාලව නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කර ඇති බව නිවේදනය කරමි.

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ලැගුම් නිවාස හා නවාතැන්පලක කාර්යය සඳහා කිසියම් පරිශ්‍රයක් පාවිච්චි කරන තැනැත්තෙකු විසින් ආරම්භ කළ දින සිට දින 30ක් ඇතුලත බලපත්‍ර ගාස්තුවක් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. සේනානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2016 අගෝස්තු මස 31 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණ අංක 2610- XIII**

වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද 2011.01.18 දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද බවට 2011.04.28 දිනැති අංක :1703/18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටස මගින් ප්‍රකාශයට පත්කර ඇති ලැගුම් නිවාස හා නවාතැන් පොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව වාරියපොල ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කළ යුතු බවට 2010.09.28 වැනි දින පැවැති මහ සභාව විසින් පිළිගෙන අංක 1714 හා 2011.07.08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසෙන් නිවේදනය කර ඇති අතර එම අතුරු ව්‍යවස්ථාව 2017 වර්ෂය තුළ වාරියපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බවටත් මම යෝජනා කරමි.

තව ද යම් ස්ථානයක්, හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පලක කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන්නේ ද 1968 අංක 14 දරන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද අනුමත කර හෝ පිළිගන්නාවූ ද අවස්ථාවක අයකළ යුතු ගාස්තුව අයකරනු ලැබූ අවුරුද්දට පෙරාතුව අවුරුද්දේ මුළු ආදායමින් 1% ක මුදලක් බදු ගාස්තුවක් වශයෙන් ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු බවටත් මම තීරණ කරමි.

09-890/13

---

## වාරියපොල ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

වාරියපොල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන වාරියපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් යාපා මුදියන්සේලාගේ සේනානායක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 22(4) හා 122-126 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2017 වර්ෂයට අදළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍ර ලබා ගැනීමට ගාස්තු අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කර ඇති බව නිවේදනය කරමි.

වයි. එම්. සේනානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2016 අගෝස්තු මස 31 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණ අංක 2610 - IX**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 22(4) හා 122-126 වැනි වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 දිනැති අංක 520/7 දරන පළාත් පාලන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට, ජලාශයකට, හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් (බැනර් ඇතුළුව) ඉදිකිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ දර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛණයේ දැක්වෙන ගාස්තු 2017 වර්ෂය සඳහා නියම විය යුතු බවට තීරණය කරමි.

*උපලේඛනය*

| *අනු. අංකය* | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | |
|---|---|---|---|
| | | | *රු. ශ.* |
| 01. | බිත්තියක හෝ තාප්පයක, පුවරුවක, ලෑල්ලක හෝ ආධාරයකයක් මගින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා (සෑම වසරකම ගෙවිය යුතුය) | වර්ග අඩියකට | 60 0 |
| 02. | එක් මසකට වැඩි මාස 03කට අඩු කාල සීමාවක් සඳහා ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා | වර්ග අඩියකට | 30 0 |
| 03. | මාස 01ක් හෝ ඊට අඩු කාලයක් තුල ප්‍රදර්ශනය කෙරෙන බැනරයක් සඳහා | වර්ග අඩියකට | 20 0 |
| 04. | කටවුට් සඳහා මාස 03කට වැඩි කාල සීමාවකට | වර්ග අඩියකට | 40 0 |
| 05. | කටවුට් සඳහා මාස 03කට අඩු කාල සීමාවකට | වර්ග අඩියකට | 30 0 |
| 06. | සභාව සතු වාරියපොල නගරයේ ඇති භූමිය තාවකාලික වෙළඳ කුටි, එළිමහන් ප්‍රදර්ශන ප්‍රචාරක වැඩසටහන් ආදිය පැවැත්වීම සඳහා කුලියට ලබාදීම (එක් දිනක් සඳහා) | වර්ග අඩියකට | 20 0 |
| 07. | චිත්‍රපට සංස්ථාව විසින් අනුමත කර ඇති චිත්‍රපට පෙන්වන ශාලාව හැර ඉන් පරිබාහිරව පෙන්වනු ලබන චිත්‍රපට දර්ශන, ආධාර චිත්‍රපට දර්ශන මැජික් සංදර්ශන, සර්කස් සංදර්ශන, නැටුම් සංදර්ශන හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම අලෙවි කරනු ලබන සෑම ප්‍රවේශ පත්‍රයකින්ම 10%ක බදු මුදලක් ගෙවිය යුතු ය. | | |
| 08. | ප්‍රසිද්ධ සංදර්ශන බලපත්‍ර ගාස්තුව (එක් දිනක් සඳහා) | | 1,000 0 |

09-890/9

---

## වාරියපොල ප්‍රාදේශීය සභාව

### සේවා සඳහා ගාස්තු අයකිරීම

වාරියපොල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන වාරියපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් යාපා මුදියන්සේලාගේ සේනානායක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2017 වර්ෂයට අදළව සේවා සඳහා ගාස්තු අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කර ඇති බව නිවේදනය කරමි.

වයි. එම්. සේනානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2016 අගෝස්තු මස 31 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණ අංක 2610-X**

1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව බලපත්‍ර ගාස්තුව හා ප්‍රාදේශීය සභා පනතේ 49(7) වගන්තිය ප්‍රකාරව නොපවරා ගැනීමේ පරීක්ෂණ ගාස්තු ද, නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට අනුව හා ගෘහ හා නගර නිර්මාණ ආඥාපනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වගන්තිය පරිදි වීථි නිවාස නොවන ස්ථානවලින් ලබාගනු ලබන කසළ සඳහා ගාස්තුවක් ද, 2017 වර්ෂයට නියම විය යුතු යැයි මම තීරණය කරමි.

*උපලේඛනය*

| *I වැනි තීරුව* <br> *විස්තරය* | *II වැනි තීරුව* <br> *අය කරන ගාස්තුව* <br> *රු. ශ.* |
|---|---|
| 1. පරිසර ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 500 0 |
| 2. පරීක්ෂණ ගාස්තුව | වටිනාකම අනුව |
| 3. බලපත්‍රය අළුත්කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 250 0 |
